# 1 උපන් දිනයක්. . . .



"ආ . . . එන්න, සමන් පුතා එන්න."

"ආයුබෝවන්, පුතා."

"ආයුබෝවන්, මාමෙ."

"කෝ මාමෙ, කමල්?"

"පුතා, මෙන්න යාළුවෙක් ඇවිත්."

"අද කමල්ගේ උපන් දිනය නෙ මාමෙ."

"ඔව්, ඔව්, ඔන්න නැන්දත් ඒකට සූදානම් වෙනවා."

"පුතා, මොනවද ඔය? තෑගිත් අරගෙන ඇවිත් වගේ."



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

"ඔව් මාමේ, කමලුයි මායි හොඳ ම යාළුවො නෙ."

"සමන්, එන්න එන්න."

"කමල්, ඔයාට සුබ උපන් දිනයක් වේවා! මෙන්න මගෙන් ඔයාට පුංචි තෑග්ගක්."

"බොහොම ස්තුතියි, සමන්."

"අද නිවාඩු දවසක්. අපට සෙල්ලම් කරන්නත් පුළුවන් නේ."

"සමන්, මේ ඉන්නේ අචලා අක්කා. එයා අපේ පුංචි අම්මාගේ දුව."



"අචලා අක්කා හඳුනා ගන්න ලැබීම සතුටක්."

"බොහොම ස්තුතියි."

"කමල් පුතා, අක්කයි සමන් පුතයි එක්ක එන්න තේ බොන්න."

"අන්න අම්මා කතා කරනවා. අපි යමු ද තේ බොන්න?"

"හා හොඳයි, අපි යමු."

“වාඩිවෙන්න පුතා.”

“නැන්දා කෑම ජාති ගොඩක් හදලා.”

“සමන්, කැමති කෑම ජාති අරගෙන කන්න.”

“හොඳයි කමල්.”

“කෑම හරි රසයි නැන්දෙ.”

“සංග්‍රහයට බොහොම ස්තුතියි”

“සමන්, අපි යමු ද සෙල්ලම් කරන්න.”

“හොඳයි, කමල් අවලා අක්කාටත් කතා කරමු.”

“දැන්නම් ගොඩක් වෙලා ගියා. මම ගිහින් එන්නම් කමල්.”

“නැන්දේ, මාමේ, මම ගිහින් එන්නම්.”

“හා හොඳයි. සමන් ආවට බොහොම ස්තුතියි.”



(සමන් වැඩිහිටියන්ට වැන්දා)

“පුතාට බුදු සරණයි! දෙවි පිහිටයි!

ගිහින් එන්න.”

## ක්‍රියාකාරකම 1

(i) ගුරුතුමා / ගුරුතුමිය පාඩම කියවන විට හොඳින් අසා සිටින්න.

(ii) පාඩම සංවාදයක් ලෙස ශබ්ද නගා කියවන්න.

(iii) ඔබ ලැබූ මෙවැනි අත්දැකීමක් හෝ සිදුවීමක් හෝ පන්තියට කියන්න.

## ක්‍රියාකාරකම 2

පාඩම ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න. ඊට පසු ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

(i) පාඩමේ සඳහන් වැදගත් දිනය කුමක් ද?

(ii) කමල්ගේ නිවසට ආ යාළුවා කවුද?

(iii) කමල්ගේ පුංචි අම්මාගේ දුවගේ නම කුමක් ද?

(iv) සෙල්ලම් කරන්න පුළුවන් කිව්වේ ඇයි?

(v) අම්මා ළමයින්ට කතා කළේ කුමකට ද?

## ක්‍රියාකාරකම 3

පහත දැක්වෙන රූප දෙස බලා වඩාත් ගැළපෙන වගන්තිය තෝරා කියන්න. ඒවා ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

### අපේ ගෙදර



(i) අක්කා උඩ පනිනවා.
(ii) අක්කා අතුගානවා.
(iii) අක්කා අඬනවා.



(i) තාත්තා ගමේ යනවා.
(ii) තාත්තා වැඩට යනවා.
(iii) තාත්තා බඩු ගේනවා.



(i) අම්මා හාල් මනිනවා.

(ii) අම්මා හාල් ගරනවා.

(iii) අම්මා බත් උයනවා.



(i) අයියා පැළ සිටුවනවා.

(ii) අයියා මල් කඩනවා.

(iii) අයියා පොළොව කොටනවා.



(i) නංගී රෙදි මනිනවා.

(ii) නංගී රෙදි සෝදනවා

(iii) නංගී රෙදි නමනවා.



(i) මල්ලී වතුර දමනවා.

(ii) මල්ලී මල් සිටුවනවා.

(iii) මල්ලී මල් කඩනවා.

## ක්‍රියාකාරකම 4

සමහර වචන වෙනත් පද සමග එකතු වී යෙදෙන අයුරු පහත දැක්වේ. ඒවා හඳුනා ගන්න. එබඳු වචන පාඩමෙන් ගෙන අදාළ කොටුවේ ලියන්න. හඬ නගා කියන්න.

| යාළුවා<br>තාත්තා | යාළුවා නෙ<br>තාත්තා නෙ | යාළුවා ද?<br>තාත්තා ද? | යාළුවා නේ ද?<br>තාත්තා නේ ද? |
|---|---|---|---|
| | | | |

## ක්‍රියාකාරකම 5

(i) දී ඇති උදාහරණයට අනුව පහත දැක්වෙන පද සකස් කර ලියන්න, කියවන්න.

| | | | |
|---|---|---|---|
| (i) අම්මා | අම්මා නේ | අම්මා ද? | අම්මා නේ ද? |
| (ii) සීයා | . . . . . . . . . | . . . . . . . . | . . . . . . . . . . |
| (iii) බාප්පා | . . . . . . . . | . . . . . . . . | . . . . . . . . . . |
| (iv) අක්කා | . . . . . . . . . | . . . . . . . . | . . . . . . . . . . |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

(ii) පහත සඳහන් උදාහරණයේ දක්වා ඇති පරිදි සීයා, බාප්පා, අක්කා යන වචන වාක්‍යයේ හිස්තැනට ගළපා කියන්න.

උදාහරණ :- මේ නිමල්ගෙ අම්මා.

මේ නිමල්ගෙ අම්මා නෙ.

මේ නිමල්ගේ අම්මා ද?

මේ නිමල්ගේ අම්මා නේ ද?

මේ නිමල්ගේ. . . . . . . .

## ක්‍රියාකාරකම 6

පහත දක්වා ඇති වාක්‍ය කියවා වටහා ගන්න.

අ. (i) නැන්දත් ඒකට සූදානම් වෙනවා.
(ii) පුතා නැගිත් අරගෙන ඇවිත් වගේ.

ආ.(i) කමලුයි මායි හොඳ ම යාළුවො.
(ii) අක්කයි සමන් පුතයි එක්ක එන්න, තේ බොන්න.

## ක්‍රියාකාරකම 7

පහත දැක්වෙන වැකිවල හිස්තැනට ගැළපෙන වචන දී ඇති වචනවලින් තෝරා ලියන්න. ඒවා ශබ්ද නගා කියවන්න.

(i) අද අපට සෙල්ලම් ______________ පුළුවන් නේ.

(ii) මෙන්න ________________ ඇවිත්.

(iii) _______________ ගමේ ගිහිල්ලා.

(iv) ______________ ගිහින් එන්න.

(v) _______________ සෙල්ලම් කරනවා.

(නැන්දයි මාමයි/පාසලටත්/මල්ලියි මායි/අක්කත්/කරන්නත්)

තවත් එවැනි පද පාඩමෙන් සොයා ලියන්න.

## ක්‍රියාකාරකම 8

මේවා කියවන්න.

**සුබ පැතුම් / ආශිර්වාද**

සුබ උපන් දිනයක් වේවා!

දෙවි පිහිටයි!

සෙත් වේවා!

සුබ නව වසරක් වේවා!

තිසරණ සරණයි!

**ඉල්ලීම් / ආරාධනා**

එන්න, වාඩි වෙන්න.

අත සෝදා ගන්න.

පොත කියවන්න.

හෙට අපේ ගෙදර එන්න.

වතුර වීදුරුවක් දෙන්න.

අසරණයන්ට පිහිට වෙන්න.

මල් පැළයක් සිටුවන්න.

## ක්‍රියාකාරකම 9

සුබ පැතුම් හා ඉල්ලීම් කිහිපයක් පහත දැක්වේ. ඒවා වෙන් කර ඊට අදාළ කොටස යටතේ ලියන්න. ශබ්ද නගා කියවන්න.


බුදු සරණයි!
නංගිට කතා කරන්න.
ලස්සන සිංදුවක් කියන්න.


ශාන්ති වේවා!
මට බෝලය දෙන්න.
ඔබට ජය වේවා!
ආයුබෝවන් !
දළදා සමිඳු පිහිටයි !
මට වතුර දෙන්න.

මල්ලි නැගිටින්න.
ජේසු පිහිටයි !
ඔබට සුබ දවසක් !
අල්ලා දෙවි පිහිටයි !
ටිකක් එහාට වෙන්න.
තිසරණ සරණයි!

**සුබ පැතුම්**

**ඉල්ලීම්**





## ක්‍රියාකාරකම 10

උදාහරණයට අනුව ආශිර්වාද (ප්‍රාර්ථනා) ක්‍රියා සකස් කර ලියන්න.

උදාහරණය :- නිරෝගී වෙනවා.- නිරෝගී වේවා!

(i) නිදුක් වෙනවා. - . . . . . . . . . . . .

(ii) ජය වෙනවා. - . . . . . . . . . . . .



නොමිලේ බෙදා හැරීම සඳහා ය.


(iii) සුවපත් වෙනවා. - . . . . . . . . . . .


(iv) සැප වෙනවා. - . . . . . . . . . . .

## ක්‍රියාකාරකම 11


**(හඳුනා ගන්න, ලියන්න, කියවන්න.)**

පහත දැක්වෙන රූපවලට අදාළ වාක්‍යය තෝරා ලියන්න.





.............................................. ................................................





.............................................. ...............................



....................................

1. හාවා පනිනවා.

2. ගොනා වත්තේ ඇවිදිනවා.

3. ඉබ්බා හෙමින් යනවා.

4. ඇතා විශාලයි.

5. බළලා පුරු පුරු ගානවා.

## ක්‍රියාකාරකම 12

අසන්නා ගැන සැලකිලිමත් වෙමින් ප්‍රසන්නව කතා කිරීමට හුරු වෙමු.

මේ සංවාදය කියවන්න.

අම්මා - ඔක්කොම එක්ක එන්න තේ බොන්න.

කමල් - අපි යං තේ බොන්න.

අචලා - මල්ලී තේ බොන්න ඉස්සර වෙලා අත සෝදාගන්න.

අම්මා - අද අපේ පුතාගේ උපන් දිනේ නෙ. පුතාලා කැමති කෑම අරගෙන කන්න.



සමන් - මට කෙසෙල් ගෙඩියක් දෙන්න, නැන්දේ.

අම්මා - ඇඹුල් කෙසෙල්, සීනි කෙසෙල්, කෝලිකුට්ටු කෙසෙල් තියෙනවා.

පුතා කන්න කැමති මොනවාද?

සමන් - මට සීනි කෙසෙල් ගෙඩියක් දෙන්න.

කමල් - සමන් වැඩිපුර කන්න කැමති පලතුරු මොනවා ද?

සමන් - ගස්ලබු, ජම්බු, අඹ, නාරං, දෙඩම්, පේර. මේ හැම ජාතියකටම මම කැමතියි.

කමලා - බොහොම ස්තුතියි නැන්දේ. අක්කා වැලිතලපවලට ආසයි නේ ද?

අචලා - ඔව්, අලුවා, කොකිස්, ආස්මී, කැවුම්, මුරුක්කු, පැණිවළලු ඔය හැම දේකටම ආසයි.

සමන් - තේ එක නම් හරි රසයි නැන්දේ.